# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු

**13 ශ්‍රේණිය**

**ව්‍යාපාර අධ්‍යයනය I** | 32 | S | I | **පැය දෙකයි**

නම :- ......................................................................

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

01. වුවමනා වල ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර වන්නේ,
1. පොදු වීම, නිර්මාණය කළ හැකි වීම, සීමිත වීම.
2. අත්‍යවශ්‍ය වීම, අසීමිත වීම, පොදු වීම.
3. පුද්ගල බද්ධ වීම, ප්‍රාථමික වීම, නිර්මාණය කළ හැකි වීම.
4. අසීමිත වීම, විවිධ වීම, නිර්මාණය කළ හැකි වීම.
5. අසීමිත වීම, අත්‍යවශ්‍ය වීම, විවිධ වීම.

(............)

02. ''මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට ඇති ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාර ලෙසට හඳුනා ගනී'' ලාභ අපේක්ෂාවෙන් පමණක් ඇති ව්‍යාපාර හඳුන්වන්නේ,
1. පෞද්ගලික ව්‍යාපාර ලෙසය.
2. ව්‍යාපාර සංවිධාන ලෙසය
3. වාණිජ ව්‍යාපාර ලෙසය.
4. රාජ්‍ය ව්‍යාපාර ලෙසය
5. ස්වේඡා සංවිධාන ලෙසය.

(............)

03. ව්‍යාපාර ගති ලක්ෂණ ඇතුලත් පිළිතුරු කාණ්ඩය වන්නේ,
1. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම, සම්පත්වලට අගයන් එකතු කිරීම, විකුණුම් හෝ හුවමාරු සිදුවීම.
2. ආර්ථික කටයුත්තක් වීම, අවශ්‍යතා වුවමනා සපුරාලීම, අවදානමක් තිබීම.
3. විකුණුම් හෝ හුවමාරුවීම් සිදු වීම, නවෝත්පාදනය, ගනුදෙණු අඛණ්ඩව සිදු වීම.
4. වුවමනා නිර්මාණය කිරීම, ලාභයෙන් අභිප්‍රේරණය වීම, ආර්ථික කටයුත්තක් වීම.
5. භාණ්ඩ හා සේවා ගනුදෙණු සිදු වීම, සමාජ හා ප්‍රජාවගේ සුභසාධනය, අවදානමක් තිබීම.

(............)

04. ''ව්‍යාපාර, මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට මෙන්ම ආර්ථිකයේ පැවැත්මට ද දායක වේ.'' මෙහි ආර්ථිකයේ පැවැත්මට ව්‍යාපාර දායක වන ආකාර ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ,
1. රැකියා උත්පාදනය, විකුණුම් උපරිම කිරීම, නවෝත්පාදනය
2. නවෝත්පාදනය, සමාජ හා ප්‍රජාවගේ සුභ සාධනය, වුවමනා නිර්මාණය කිරීම.
3. වෙනස්වන සංකීර්ණ වුවමනා සපුරාලීම, රැකියා උත්පාදනය ලාභ උපරිම කිරීම.
4. රැකියා උත්පාදනය, විකුණුම් උපරිම කිරීම, ජාතික ආර්ථික සංවර්ධනය
5. ජාතික ආර්ථික සංවර්ධනය, නවෝත්පාදනය, වෙනස්වන සංකීර්ණ වුවමනා සපුරා ලීම.

(............)

05. අතීතයේ සිට වර්තමානය දක්වා නිෂ්පාදනයේ ක්‍රමික විකාශනයට අදාළව පහත වගන්ති දක්වා ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - | පුද්ගල විශේෂිකරණය | B | - | භාණ්ඩ හුවමාරුව |
| C | - | අතිරික්ත නිෂ්පාදනය | D | - | ඍජු නිෂ්පාදනය |
| E | - | වෙළඳාම ඇති වීම | F | - | වක්‍ර නිෂ්පාදනය |

අනු පිළිවෙලින් නිෂ්පාදන අවධි දක්වා ඇත්තේ,
1. DACEBF
2. DAEBCF
3. DACBEF
4. ADCBEF
5. ADBCFE

(............)

www.artsapi.lk

06. පහත වගුවේ A තීරුව මගින් ව්‍යාපාර වර්ගීකරණය පදනම් ද B තීරුවෙන් එම පදනම් අනුව වර්ග කෙරෙන ආකාරයෙන් ද දක්වේ,

| | A | | B |
|---|---|---|---|
| a. | නිෂ්පාදනයේ ස්වභාවය අනුව | 1. | කෘෂි, කාර්මික, සේවා |
| b. | අරමුණ අනුව | 2. | පෞද්ගලික, පොදු |
| c. | නිෂ්පාදන අංශ අනුව | 3. | සුළු හා මධ්‍ය, මහා |
| d. | හිමිකාරිත්වය අනුව | 4. | ලාභ ලැබීම, සමාජ සුභසාධනය |
| e. | පරිමාණය අනුව | 5. | ප්‍රාථමික, ද්වීතික, තෘතීක |

එක් එක් ව්‍යාපාර වර්ගීකරණ පදනමට ගැලපෙන ව්‍යාපාර වර්ගයන් නිවැරදිව දක්වා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. a - 1, b - 4, c - 5, d - 2, e - 3
2. a - 5, b - 4, c - 1, d - 3, e - 2
3. a - 5, b - 2, c - 1, d - 3, e - 4
4. a - 5, b - 4, c - 1, d - 2, e - 3
5. a - 5, b - 2, c - 4, d - 1, e - 3

(............)

07. ව්‍යාපාර ආයතනයක සිදුවන කාර්යයන් කීපයක් හා ඊට අදාළ නිදසුන් කීපයක් පහත දක්වා ඇත.

| | කාර්යය | | නිදසුන් |
|---|---|---|---|
| A | පරිපාලනය | 1. | සේවකයන්, පුහුණු කිරීම, බඳවා ගැනීම, සුභසාධන කටයුතු |
| B | නිෂ්පාදනය | 2. | මිල තීරණය, බෙදා හැරීම. |
| C | අලෙවිකරණය | 3. | නිෂ්පාදන වැඩි දියුණු කිරීම, නව නිර්මාණ පිළිබඳ සොයා බැලීම. |
| D | මානව සම්පත් කටයුතු | 4. | සේවක ලිපිගොනු සැකසීම, පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම |
| E | පර්යේෂණය හා සංවර්ධන | 5. | අමු ද්‍රව්‍ය සපයා ගැනීම, තොග පාලනය |

ව්‍යාපාර කාර්යයන් හා නිදසුන් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. A - 4, B - 3, C - 2, D - 5, E - 1
2. A - 1, B - 3, C - 5, D - 4, E - 2
3. A - 1, B - 5, C - 2, D - 3, E - 4
4. A - 4, B - 5, C - 2, D - 1, E - 3
5. A - 4, B - 5, C - 3, D - 1, E - 2

(............)

08. පාරිභෝගික රුචිය අනුව විවිධ මෝස්තර වෙළඳපොලේ බිහි වී ඇත. **මෝස්තර** අයත් නිෂ්පාදන සම්පත වන්නේ,

1. දැනුම
2. ව්‍යවසාය
3. තොරතුරු
4. ප්‍රාග්ධනය
5. ශ්‍රමය

(............)

09. ව්‍යාපාරයක් ඉටු කළ යුතු සමාජ වගකීම් කීපයක් පහත දක්වේ. ඒ ඇතුරින් ගනුදෙනුකරුවන් සඳහා පමණක් අදාළ වන සමාජ වගකීම් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. සාධාරණ වීම, හානි අවම වීම , සමානාත්මතාව
2. සමානාත්මතාව , අයිතිවාසිකම් ආරක්ෂා වීම , හානි අවම වීම.
3. පරිසර හිතකාමී වීම , හානි අවම වීම , අයිතිවාසිකම් ආරක්ෂා වීම.
4. සාධාරණ වීම , හානි අවම වීම , අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
5. සාමානාත්මතාව, ප්‍රජා සත්කාර සේවා , සාධාරණ වීම.

(............)

10. ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කල යුතු කරුණු පමණක් ඇතුළත් වන්නේ,

1. තරගකාරීත්වය, සම්පත් පරිභෝජනය , සේවා නියුක්තිය , අවදානම් කළමනාකරණය
2. තරගකාරීත්වය , අවදානම් කළමනාකරණය , සංස්කෘතික පරිසරය සුරැකීම , කාර්යක්ෂමතාවය.
3. කාර්යක්ෂමතාව , සේවා නියුක්තිය , තරගකාරීත්වය , අන්තර්ජාතික වෙළඳාම
4. අන්තර්ජාතික වෙළඳාම , අවදානම් කළමණාකරණය , තරගකාරීත්වය , සංස්කෘතික පරිසර සුරැකීම.
5. සේවා නියුක්තිය , සංස්කෘතික පරිසර සුරැකීම , අවදානම් කළමණාකරණය ,කාර්යක්ෂමතාවය.

(............)

www.artsapi.lk

11. පහත වගුවේ x තීරුවේ ආචාර විධි ධර්ම කීපයක් හා Y තීරුවෙන් ඒවා කඩවීම් පිළිබඳ ප්‍රකාශ කීපයක් දක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මානව සම්පතට අදාළ ආචාර ධර්ම | A | වෙළඳ ලකුණ වංචනික ලෙස යොදා ගැනීම. |
| 2. | නිෂ්පාදනයට අදාළ ආචාර ධර්ම | B | කොටස් වෙළඳපල තුළ සිදුවන මූල්‍ය වංචා |
| 3. | බුද්ධිමය දේපලට අදාළ ආචාර ධර්ම | C | සාවද්‍ය තොරතුරු ප්‍රචාරණය. |
| 4. | ගිණුම්කරණයට අදාළ ආචාර ධර්ම | D | වෘත්තීය අනාරක්ෂිත බව. |
| 5. | අලෙවිකරණයට අදාළ ආචාර ධර්ම | E | ජාන වෙනස් කරන ලද අස්වාභාවික ආහාර ද්‍රව්‍ය. |

ඉහත X හා Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. 1-D, 2-A, 3-C, 4-B, 5-E
2. 1-C, 2-E, 3-A, 4-B, 5-D
3. 1-D, 2-E, 3-A, 4-B, 5-C
4. 1-B, 2-A, 3-E, 4-C, 5-D
5. 1-D, 2-E, 3-A, 4-C, 5-B

(............)

12. ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩ නැගීමේ දී අදාළ කර ගන්නා කරුණු වන්නේ,

1. රාජ්‍ය සේවකයා, ව්‍යාපාරය , තරගකරුවන්
2. තරගකරුවන්, සමාජ සංස්කෘතිය , සේවකයා , ව්‍යාපාරය
3. ලාභය , තරගකරුවන් , ගනුදෙණුකරු , ව්‍යාපාරය
4. සමාජ සංස්කෘතිය, ප්‍රායෝගික බව , ආයෝජකයින්
5. සමාජය , ව්‍යාපාරය , ප්‍රායෝගික බව , ආයෝජකයින්

(............)

13. සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇති වන බලපෑම් පිළිබඳවත්, පෞද්ගලිකවම ව්‍යාපාර වගකීම සමාජ වගකීම් වන බව දක්වා ඇත්තේ,

1. ජපානය
2. පිලිපීනය
3. ඇමෙරිකා එක්සත් ජනපදය
4. බ්‍රිතාන්‍ය
5. චීනය

(............)

14. පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක බැංකු කිපයකි.

A - ජාතික ඉතිරි කිරීමේ බැංකුව
B - මහජන බැංකුව
C - ජාතික සංවර්ධන බැංකුව
D - DFCC වර්ධන බැංකුව
E - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
F - සණස සංවර්ධන බැංකුව

මේවා අතුරින් බලපත්‍ර ලාභී විශේෂිත බැංකු කවරේ ද?

1. A, C, E හා F පමණි
2. A, C හා D පමණි
3. B, D හා E පමණි
4. D, E හා F පමණි
5. A, E හා F පමණි

(............)

15. මහජනයාගේ තැන්පතු භාර ගැනීම සඳහා බලය ඇති ආයතන පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ව්‍යාපාර බැංකු , කල්බදු සමාගම් , ලියාපදිංචි මූල්‍ය සමාගම්
2. බලපත්‍රලාභි විශේෂිත බැංකු , බලපත්‍රලාභි වාණිජ බැංකු , ලියාපදිංචි මූල්‍ය සමාගම්
3. සමුපාකාර සමිති , ඒකක භාර , කල්බදු සමාගම්
4. සමුපකාර සමිති, ව්‍යාපාර බැංකු , ඒකක භාර
5. බලපත්‍ර ලාභි විශේෂිත බැංකු , ව්‍යාපාර බැංකු , ලියාපදිංචි මූල්‍ය සමාගම්

(............)

16. තෙවන පක්ෂ මොටර් රථ රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය වන්නේ,

1. මෝටර් රථයේ අයිතිකරුට හා රියදුරුට සිදු වන හානි
2. මෝටර් රථයේ ගමන් කරන මගින්ට හා ගෙන යන භාණ්ඩ වලට සිදු වන හානි
3. මෝටර් රථයට හා බාහිර දේපල වලට සිදුවන
4. බාහිර පුද්ගලයන්ට හා බාහිර දේපල වලට සිදුවන හානි
5. මෝටර් රථයේ ගෙන යන භාණ්ඩ වලට සහ බාහිර දේපල වලට සිදුවන හානි.

(............)

www.artsapi.lk

17. මහා මාර්ග පරිවහනයේ සහ දුම්රිය පරිවහනයේ වාසි කිපයක් පහත දැක්වේ. දුම්රිය පරිවහනයේ වාසියක් ලෙස නොසැලකෙන්නේ,
1. බරින් වැඩි භාණ්ඩ පහසුවෙන් පරිහරණය කළ හැකි වීම.
2. ප්‍රවාහන පිරිවැය අඩු වීම.
3. භාණ්ඩ වල ස්වභාවයට ගැලපෙන ප්‍රවාහන ක්‍රම තිබීම.
4. වැඩි ව්‍යාප්තිය.
5. ආරක්ෂාකාරිව භාණ්ඩ ප්‍රවාහනය කළ හැකිවීම.

(............)

18. සන්නිවේදන මාධ්‍යක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු නිවැරදි කරුණු දැක්වෙන වාක්‍ය කණ්ඩය තෝරන්න.
1. වේගය / සංක්ෂිප්ත බව / රහස්‍ය භාවය / පිරිවැය
2. පිරිවැය / සුලබතාවය / ආරක්ෂාව / දුර ප්‍රමාණය
3. ධාරිතාව / රහස්‍යභාවය / වාර්තා විය යුතු බව / දුර ප්‍රමාණය
4. වේගය/ දුර ප්‍රමාණය / නිවැරදිතාවය / ප්‍රතිපෝෂණය
5. පිරිවැය / සුලභතාව / වේගය / සංක්ෂිප්ත බව

(............)

19. මෑතක් සිට තොග වෙළන්ඳාගේ වැදගත් කම අඩු වෙමින් පවති. එසේ වීමට බලපෑ හේතුවක් නොවන්නේ,
1. මහා පරිමාණ සිල්ලර වෙළඳුන් (සුපිරි වෙළඳහල්) බිහි වීම.
2. සෘජු අලෙවිය වර්ධනය වීම.
3. රජයේ මිල පාලනය හේතුවෙන් තොග වෙළඳුන් එම ක්ෂේත්‍රයෙන් ඉවත් වීම.
4. භාණ්ඩ බොහෝමයක් තාක්ෂණික ඒවා වීම නිෂ්පාදකයා ගෙන්ම ලබා ගත යුතු වීම.
5. විද්‍යුත් සිල්ලර වෙළඳාම දියුණු වීම/ විද්‍යුත් වාණිජ්‍යයේ දියුණුව

(............)

20. පහත දැක්වෙන කාණ්ඩ අතුරින් ආසියාන් (ASEAN) සංවිධානයට අයත් රටවල් කීපයක් පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
1. බෲනායි , භූතානය , මලයාසියාව , සිංගප්පූරුය , ශ්‍රී ලංකාව
2. බෲනායි , ඉන්දුනීසියාව , මලයාසියාව , සිංගප්පූරුව , තායිලන්තය
3. බංගලාදේශය , භූතානය , මාලදිවයින , නේපාලය , ශ්‍රී ලංකාව
4. ඇෆ්ගනිස්ථානය , බංගලදේශය , ඉන්දියාව , නේපාලය
5. බෲනායි , භූතානය , ඉන්දියාව , මලයාසියාව , තායිලන්තය

(............)

21. පහත දැක්වෙන්නේ නිෂ්පාදන ක්‍රම වලට අදාල ලක්ෂණ කිපයකි.

A - පරිභෝගික තෘප්තිය ඉහල මට්ටමකට පවත්වාගත හැකි වීම.
B - කලින් කලට නිෂ්පාදිතයේ නිමාව වෙනස් කල හැකි වීම.
C - විශාල ආයෝජනයක් අවශ්‍ය වීම.
D - සමස්ත වෙළඳපල පිළිබඳ අවධානය යොමු කිරීම.
E - වෙළඳපල මුල් කර ගෙන නිෂ්පාදන සිදු නොවීම.
F - නවීන තාක්ෂණය පහසුවෙන් යොදා ගත හැකි වීම.

මේ අතුරින් ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයට අදාල ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර කුමක් ද?
1. B , C හා E
2. C , D හා F
3. A , C හා F
4. B , D හා E
5. C , D හා E

(............)

22. ''එකම කාර්යයක නියලි සිටින සේවකයන් කුඩා කණ්ඩායම් වශයෙන් එක් වී සාකච්ඡා කරමින් ඔවු නොවුන් මුහුණපාත ගැටලු හඳුනා ගෙන ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම'' මින් කියවෙන්නේ,
1. තත්ත්ව කව පිළිබඳවය.
2. සමස්ත ගුණත්ව කළමණාකරණය පිළිබඳවය.
3. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය පිළිබඳවය.
4. තත්ත්ව ආකර්ශනය පිළිබඳවය.
5. ශූන්‍ය දෝෂ ශිල්ප ක්‍රමය පිළිබඳවය.

(............)

www.artsapi.lk

23. සපලදායි වෙළඳපල බණ්ඩනයක් සඳහා තිබිය යුතු ගුණාංග පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
1. මැනිය හැකි බව , ප්‍රමාණාත්මක බව , ක්‍රියාත්මක කළ හැකි බව , නිශ්චිත බව
2. නිශ්චිත බව , තාත්වික බව , ළඟා විය හැකි බව , ප්‍රමාණවත් බව
3. වෙන් කොට හඳුනාගත හැකි බව , ප්‍රමාණවත් බව , මැනිය හැකි බව , ක්‍රියාත්මක කළ හැකි බව
4. ක්‍රියාව පදනම් විම , නිශ්චිත බව , ප්‍රමාණවත් බව
5. නිශ්චිත බව , මැනිය හැකි බව , ප්‍රමාණවත් බව , ක්‍රියාව පදනම් වීම.

(............)

24. පහත සඳහන් වන්නේ සිසුවෙකු විසින් සිදු කරන ලද ප්‍රකාශ කිහිපයකි. ඉන් එකග විය හැකි ප්‍රකාශය කුමක් ද?
1. සාධ්‍යකරණය අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගයකි.
2. අවධානමට මුහුණ දීමට සුදානම් මූල්‍ය කළමණාකරුවන් නිතර තෝරා ගනු ලබන්නේ හිමිකරු මූල්‍යනයයි.
3. කොටස් නිකුතුව හා ණයකර නිකුතුව වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග දෙකකි.
4. කාරක ප්‍රාග්ධනය දැඩිව පාලනය කිරීම. අභ්‍යන්තර මූල්‍යය සම්පාදන මාර්ගයකි.
5. වාණිජ පත්‍රිකා සාධ්‍යකරණය හා ඇපකරණය දිගු හා මැදි කාලින මූල්‍ය සම්පාදන මාර්ගයන්ය.

(............)

25. පහත වගුවෙහ " x " තීරුවෙහි මූල්‍ය අනුපාත වර්ග ද " y " තීරුවෙහි ඊට අයත් අනුපාතයන් ද සඳහන්වේ.

| | | | | |
|---|---|---|---|---|
| A | - | තෝලන අනුපාත | 1. | ණයගැති පිරිවැටුම් අනුපාතය |
| B | - | ලාභදායිත්ව අනුපාත | 2. | ජංගම අනුපාතය |
| C | - | ක්‍රියාකාරි අනුපාත | 3. | ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය |
| D | - | ද්‍රවශිලතා අනුපාත | 4. | පොළී ආවරණ අනුපාතය |

X තීරුව හා Y තීරුව නිවැරදි ගැලපු විට ලැබෙන පිළිතුරු වන්නේ මින් කුමක් ද?
1. A - 1 , B - 3 , C - 4 , D - 2
2. A - 3 , B - 4 , C - 2 , D - 1
3. A - 4 , B - 1 , C - 2 , D - 3
4. A - 3 , B - 2 , C - 4 , D - 1
5. A - 4 , B - 3 , C - 1 , D - 2

(............)

26. හර ප්‍රතිලාභ ලැබෙන පරිදි මූලික අවශ්‍යතා වලින් සමන්විතව නිෂ්පාදිතය ඉදිරිපත් කිරීම සිදු වන්නේ,
1. මූලික නිෂ්පාදිතයේ දිය.
2. අපේක්ෂිත නිෂ්පාදිතයේදිය.
3. විභව නිෂ්පාදිතයේ දිය.
4. වර්ධිත නිශ්පාදිතයේ දිය.
5. මූලික ප්‍රතිලාභයේ දිය.

(............)

27. සංවිධානයක තනතුරු සඳහා අභ්‍යන්තර සේවකයින් හා බාහිර අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරයි. මින් අභ්‍යන්තර සේවකයින් ආකර්ශනය කර ගැනීමේ ක්‍රමයක් වන්නේ,
1. මාධ්‍ය දැන්වීම් මඟින් (මුද්‍රිත/ විද්‍යුත්)
2. අතීත සේවකයින් මඟින්
3. කුසලතා ඉන්වෙන්ට්‍රි/ කුසලතා ලේඛන මඟින්
4. රැකියා නියෝජිත ආයතන මඟින්
5. අධ්‍යාපන හා වෘත්තීය ආයතන මඟින්

(............)

28. කම්හල් පිරියත සැලසුම් වර්ග හා ඒවාට අදාල නිදසුන් පහත වගුවේ දැක්වේ,

| | පිරියත සැලසුම් වර්ග | | නිදසුන් |
|---|---|---|---|
| 1. | ක්‍රියාවලි පිරියත | 1. | ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් |
| 2. | නිෂ්පාදිත පිරියත | 2. | මෝටර් රථ නිෂ්පාදන ආයතනයේ |
| 3. | කුටි පිරියත | 3. | වෘත්තීය පුහුණු ආයතනයක් ඉදි කිරීම. |
| 4. | ස්ථාවර ස්ථානීය පිරියත | 4. | ඇගලුම් කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම. |

ඉහත වගුව අනුව පිරියත සැලසුම් වර්ගයට නොගැලපෙන නිදසුන දක්වා ඇත්තේ,
1. ක්‍රියාවලි පිරියතය.
2. කුටි පිරියතය.
3. නිශ්පාදන පිරියතය
4. ස්ථාවර ස්ථානිය පිරියත

(............)

29. මූල්‍ය උපකරණවල කල් පිරිමේ කාලය පදනම කරගෙන මූල්‍ය වෙළඳපල වර්ග කරයි. ඒ අනුව ප්‍රාග්ධන වෙළඳපලට අයත් වෙළඳ පොළ කාණ්ඩය වන්නේ,
1. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල/ දේශීය විදේශීය විනිමය වෙළඳපල/කොටස් වෙළඳපල
2. වාණිජ පත්‍රිකා වෙළඳපල/ සාංගමික බැඳුම්කර වෙළඳපල/ අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල
3. භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපල/ සංගමික බැදුම්කර වෙළඳපල/ කොටස් වෙළඳපල
4. දේශීය - විදේශීය විනිමය වෙළඳපල/ අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල/ භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල
5. කොස් වෙළඳපල/ වාණිජ පත්‍රිකා වෙළඳපල/ භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල (............)

www.artsapi.lk

30. අමායා යෝගට් නිෂ්පාදන ආයතනය රැකියා විශ්ලේෂණයක් සිදු කිරීමෙන් ලබා ගන්නා ලද තොරතුරු විස්තරය හා රැකියා පිරිවිතරය වශයෙන් ගොනු ගත කරන ලදී. එහිදී රැකියා විස්තරයට ඇතුලත් වන කරුණු, අඩංගු කාණ්ඩය වන්නේ,

1. තනතුරු නාමය , පලපුරුද්ද , සේවා කොන්දේසි , අධ්‍යාපන සුදුසුකම්
2. ශාරීරික සුදුසුකම් , රැකියා ස්ථානය , සේවා කොන්දේසි , ගෙවීම් ප්‍රතිලාභ
3. ශාරීරික යෝග්‍යතාවය , පලපුරුද්ද , වෘත්තීය සුදුසුකම් , වගකිව යුත්තේ කාට ද?
4. සේවා කොන්දේසි , වැඩ කල යුතු පැය ගණන , තනතුරු නාමය , කාර්යය සාධන ඇගැයීම් පටිපාටි
5. භාෂා දැනුම , අධ්‍යාපන සුදුසුකම් , සේවා කොන්දේසි , වෘත්තීය සුදුසුකම්

(............)

**ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

31. අ. මිනිසාට ජීවත්වීම සඳහා පැවැතිය යුතු මූලික දෑ ................................ වන අතර ඒවා තෘප්තිමත් කර ගැනීමට කිසියම් පුද්ගලයකු යම් කිසි නිෂ්පාදිතයකට දක්වන විශේෂ කැමැත්ත ................................ වෙයි.

ආ. ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා හතරක් වේ භාණ්ඩ හුවමාරුව , මුදල් භාවිතය ............................. වෙයි.

32. අ. ව්‍යාපාර හා සම්බන්ධ සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීම ................................ වන අතර ව්‍යාපාර තමන් සමඟ කටයුතු කරන සියලු පාර්ශව වලට යහපතක් සිදු වන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම ..................................................... ලෙස හැඳින්විය හැකි ය.

ආ. තිරසර සංවර්ධන සංකල්පය පිළිබඳ පහත සටහනෙහි හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.




33. අ. රජයේ ................................ හා ................................ සම්බන්ධව රජය සිදු කරන කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ.

ආ. යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ ................................ හා ................................ මාර්ග වලින් ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වෙයි.

34. අ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ජාතික මෙන්ම ජාත්‍යාන්තර වශයෙන් විවිධ නිර්ණායක භාවිතා කරයි. එම නිර්ණායක පදනම් වී ඇත්තේ ................................ හා ................................ සාධක මතය.

ආ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර ප්‍රධාන වශයෙන් ................................ දිරි ගැන්වීම් හා ................................ දිරිගැන්වීම් ලෙස කොටස් දෙකකට බෙදෙයි.

35. අ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙක වනුයේ ................................ ස්ථායීතාව පවත්වා ගෙන යාම සහ ................................ ස්ථායීතාව පවත්වා ගෙන යාමයි.

ආ. චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව තුනකි................................ , ................................ හා ආදායකයා ය.

www.artsapi.lk

36. පහත දැක්වෙන්නේ මූල්‍ය ආයතන සමූහයකි. ඒවා පහත ශීර්ෂ යටතේ ලැයිස්තුගත කරන්න.

A - මහජන බැංකුව

B - සීමාසහිත සෙලින්කෝ ෆිනෑන්ස් සමාගම

C - ජාතික ඉතිරි කිරීමේ බැංකුව

D - ආශා පිලිප්ස් සුරකුම්පත් සමාගම

1. කොටස් තැරව්කාර සමාගම් ..............................................
2. බලපත්‍රලාභී වාණිජ බැංකු ..............................................
3. බලපත්‍රලාභී විශේෂිත බැංකු ..............................................
4. බලපත්‍රලාභී මුදල් සමාගම් ..............................................

37. අ. කළමනාකරණයේ දී ................................ හා ................................ ඉහළ අගයකින් අත්පත් කර ගන්නා විටක ඵලදායකත්වය ද ඉහළ අගයක් ගනී.

ආ. සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණය හා තීරණ ගැනීම ................................ විසින් සිදු කරන නිසා ඔවුන්ට ................................ වැඩිපුර අවශ්‍ය වේ.

38. අ. නියමිත කාලයක් තුළ ආයතනයක ................................ හා ................................ අතර පවතින අනුපාතික සබඳතාව ඵලදායකත්වයයි.

ආ. මුළු පිරිවැය , ................................ හා ................................ දෙකෙහි එකතුව වෙයි.

39. නිෂ්පාදිත පහත සඳහන් ලෙස වර්ගීකරණය කළ හැක. හිස්තැන්වලට සුදුසු වචන යොදන්න.




40. මූල්‍ය පද්ධතිය තුල සිදු වන ප්‍රධාන හා වැදගත් කාර්ය වන්නේ ''මූල්‍ය අතරමැදිකරණයයි'' මූල්‍ය පද්ධතියක සංයුතිය පහත සටහනෙහි හිස්තැවලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.




41. ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන 4 ක් ලියන්න.

1. ............................................ 2. ............................................

3. ............................................ 4. ............................................

42. වරලත් ව්‍යාපාර වර්ග කර උදාහරණ 1 බැගින් දක්වන්න.

| <u>ව්‍යාපාර වර්ගය</u> | <u>උදාහරණ</u> |
|---|---|
| 1. ............................................ | 1. ............................................ |
| 2. ............................................ | 2. ............................................ |
| 3. ............................................ | 2. ............................................ |

www.artsapi.lk

43. අ. ව්‍යවසායකත්ව කුසලතා 2 ක් නම් කරන්න.

1. ..............................................
2. ..............................................

44. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබාදෙන රාජ්‍ය ආයතන 4 ක් ලියන්න.

1. .............................................. 2. ..............................................
3. .............................................. 4. ..............................................

45. සංවිධාන ව්‍යුහයන් නිරූපණය වන මූල ධර්ම 4 ක් ලියන්න.

1. .............................................. 2. ..............................................
3. .............................................. 4. ..............................................

46. සාර්ථක නායකයකු තුළ තිබිය යුතු ගුණාංග 4 ක් ලියන්න.

1. .............................................. 2. ..............................................
3. .............................................. 4. ..............................................

47. අවිධිමත් සන්නිවේදනය මඟින් ව්‍යාපාර සංවිධානයකට වාසි මෙන්ම අවාසි ද ඇත් වේ. අවිධිමත් සන්නිවේදනයේ වාසි 2 ක් හා අවාසි 2 ක් ලියන්න.

| වාසි | අවාසි |
|---|---|
| 1. .............................................. | 1. .............................................. |
| 2. .............................................. | 2. .............................................. |

48. පාලන ක්‍රියාවලියේ පියවර 4 ක් ලියන්න.

1. .............................................. 2. ..............................................
3. .............................................. 4. ..............................................

49. ශ්‍රී ලංකාවේ මුදල් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වන ආයතන 2 ක් හා භාවිතා වන මූල්‍ය උපකරණ 2 ක් ලියන්න.

| ක්‍රියාත්මක වන ආයතනය | භාවිතා වන උපකරණ |
|---|---|
| 1. .............................................. | 1. .............................................. |
| 2. .............................................. | 2. .............................................. |

50. 1985 කොළඹ කොටස් (ව්‍යාපාර වස්තු) හුවමාරුව (CSE Colombo Stock Exchange) ඇරඹීමට ඒකාබද්ධ කරන ලද සමාගම් 2 නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

www.artsapi.lk